"මන්ද මානසික කාන්තාවක් කාමාතුරයන්ගෙන් රැකගන්න විඳින දුකක්" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා ලංකාදීප (08/15) පුවත්පතේ පුවත් වාර්තාවක් පළව තිබුණු අතර, එම වාර්තාව සමගින් අදාළ කාන්තාවගේ ඡායාරූප දෙකක්ද පළ වී තිබිණි. මෙම ඡායාරූපයන්හි ඇස් පමණක් බොඳ කෙරී තිබුණි. මෙම ඡායාරූප සහිත ලිපිය සමාජ මාධ්‍ය තුළද අවධානයට ලක්වී තිබිණි.

ලිංගික අතවරයන්ට ලක්වූ වින්දිතයන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තිර ප්‍රතිපත්තියක් දරයි. ඒ අනුව ගත් විට, මෙම ඡායාරූපයන්හි දෑස් පමණක් බොඳ කර තිබීම ඇගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම උදෙසා කෙතරම් ප්‍රමාණවත් වන්නේදැයි පාඨක අපට විමසීමට සිදුවේ. එසේම මෙම ඡායාරූප පළ කිරීම ඔස්සේ වක්‍රාකාරීව හෝ මෙම සිදුවීම භාවාතිෂය ලෙසින් පාඨකයන් වෙත ඉදිරිපත් නොවන්නේදැයිද පාඨක අප විමසිය යුතු වේ. එම ඡායාරූප සඳහා අදාළ මානසික ආබාධයකින් යුතු කාන්තාවගේ භාරකරුවන්ගේ කැමැත්ත ලබාගෙන තිබේද යන්න පවා ඊට අදාළ නොවේ.

එසේම 'මන්ද මානසික ආබාධිත' වැනි යෙදුමක් වෙනුවට, 'මානසික ආබාධයකින් යුක්ත' වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය නොවන්නේදැයි සිතා බැලිය යුතුයි.

ඒ අනුව, මෙම පුවත් වාර්තාව කෙතරම් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වන්නේද යන්නත්, එය කෙතරම් සමාජ සදාචාරයට ගැලපෙන්නේද යන්නත් පැනයකි.

**#MediaEthicsSL #lka #sinhalanews #SundayLankadeepa**